මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

4. සේතු පරිපථයක් රූපසටහනේ පෙන්වා ඇත. $R_1$, $R_3$ සහ $R_4$ යනු ප්‍රතිරෝධ වන අතර $R_2$ යනු විචල්‍ය ප්‍රතිරෝධයක් වේ. $G$ යනු මැද බිංදු ගැල්වනෝමීටරයකි.




(a) $R_2$ හි අගය ශුන්‍යයේ සිට ඉතා ඉහළ අගයකට වැඩිකරන විට ගැල්වනෝමීටර උත්ක්‍රමයේ ඔබ නිරීක්ෂණය කරනු ලබන විචලනය කුමක් ද?

.................................................................................................................................

(b) $R_2$ හි කිසියම් අගයකට සේතුව සංතුලනය වූ විට $R_1$ සහ $R_2$ හරහා ගලන ධාරාවන් පිළිවෙළින් $I_1$ සහ $I_2$ වේ.

(i) $R_3$ සහ $R_4$ තුළින් ගලන ධාරාවන් මොනවා ද?

.................................................................................................................

(ii) $B$ සහ $D$ අතර විභව අන්තරය කුමක් ද?

.................................................................................................................

(iii) පහත සඳහන් දෑ අතර සම්බන්ධතාවයන් ලියන්න.

$V_{AB}$ ($A$ සහ $B$ අතර විභව අන්තරය) සහ $V_{AD}$ ..........................................

$V_{BC}$ සහ $V_{DC}$ ..................................................................................

(iv) $V_{AB}$, $V_{BC}$, $V_{AD}$ සහ $V_{DC}$ සඳහා ප්‍රකාශන $R_1$, $R_2$, $R_3$, $R_4$, $I_1$ සහ $I_2$ ඇසුරෙන් ලියන්න.

$V_{AB}$ = .................................... $V_{BC}$ = ....................................

$V_{AD}$ = .................................... $V_{DC}$ = ....................................

(v) $R_4$ සඳහා ප්‍රකාශනයක් $R_1$, $R_2$ සහ $R_3$ ඇසුරෙන් ලබාගන්න.

.................................................................................................................

.................................................................................................................

(vi) $R_1 = 100\ \Omega$, $R_3 = 50\ \Omega$ සහ $R_2 = 82\ \Omega$ නම් $R_4$ හි අගය සොයන්න.

.................................................................................................................

.................................................................................................................

[ 8 වැනි පිටුව බලන්න.

www.pastpaperlk.com

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

(c) ශිෂ්‍යයෙකුට ඉහත සේතුව භාවිත කර ඉතා කුඩා $r$ ($< 1\,\Omega$) ප්‍රතිරෝධයක් මැනීමට අවශ්‍ය විය. ඔහුට පහත සඳහන් දෑ සපයා ඇත.

$10\,\Omega$, $100\,\Omega$ සහ $1000\,\Omega$ ප්‍රතිරෝධ **තුනක්**

$0 - 100\,\Omega$ සහ $0 - 1000\,\Omega$ ප්‍රතිරෝධ පෙට්ටි **දෙකක්**

ඔහු $R_4$ වෙනුවට නොදන්නා $r$ ප්‍රතිරෝධය යොදාගන්නා ලදී. $r$ හි අගය හැකිතාක් නිවැරදි ව නිර්ණය කිරීම සඳහා $R_1$, $R_2$ සහ $R_3$ වෙනුවට ඉහත සඳහන් ප්‍රතිරෝධ සහ ප්‍රතිරෝධ පෙට්ටි අතරෙන් ඔහු තෝරා ගත යුත්තේ මොනවා ද?

$R_1$ සඳහා ..................................................

$R_2$ සඳහා ..................................................

$R_3$ සඳහා ..................................................

(d) සේතුව සංතුලනය වී ඇති විට, කෝෂය සහ ගැල්වනෝමීටරය එකිනෙක මාරුකරනු ලැබුවේ නම්, ගැල්වනෝමීටරයේ උත්ක්‍රමය කුමක් වේ ද?

..................................................................................................

www.pastpaperlk.com

[ 9 වැනි පිටුව බලන්න.

03. (i) අභ්‍යන්තර පෘෂ්ඨයෙහි ප්‍රේරිත ආරෝපණය $= -1\mu c$

බාහිර පෘෂ්ඨයෙහි ප්‍රේරිත ආරෝපණය $= +1\mu c$

(ii) $E = \frac{1}{4\pi\epsilon_o}\frac{Q}{r^2}$ මගින්

$$E_p = 9\times10^9\times\frac{1\times10^{-6}}{0.2^2}$$

$$= 2.25\times10^5\ NC^{-1}$$

සන්නායකයක් තුළ විද්‍යුත් ක්ෂේත්‍රය ශුන්‍ය බැවින්

$$E_R = 0$$

$$E_T = 9\times10^9\times\frac{1\times10^{-6}}{0.05^2}$$

$$= 3.6\times10^6\ NC^{-1}$$




(iii) (a) $V = \frac{1}{4\pi\epsilon_o}\frac{Q}{r}$ මගින්

$$V_P = 9\times10^9\times\frac{1\times10^{-6}}{0.2}$$

$$= 4.5\times10^4\ V$$

$$V_Q = 9\times10^9\times\frac{1\times10^{-6}}{0.15}$$

$$= 6.0\times10^4\ V$$

සන්නායකයක් තුළ විද්‍යුත් ක්ෂේත්‍රය ශුන්‍ය බැවින්

$$V_R = V_Q = 6.0\times10^4\ V$$

$$V_S = V_Q = 6.0\times10^4\ V$$

(b) $V = \frac{1}{4\pi\epsilon_o}\sum\left(\frac{Q}{r}\right)$ මගින්

$$V_T = 9\times10^9\left\{\frac{1\times10^{-6}}{0.05} - \frac{1\times10^{-6}}{0.10} + \frac{1\times10^{-6}}{0.15}\right\}$$

$$= 15.0\times10^4\ V$$

$$V_{TS} = V_T - V_S$$

$$= 15\times10^4 - 6\times10^4$$

$$= 9\times10^4\ V$$

(c)




(iv) අතිරේකව ලබාදෙන ආරෝපණය සන්නායක කබොලෙහි ඇතුල් පෘෂ්ඨයෙහි නොරැඳේ.

∴ ඇතුල් පෘෂ්ඨයෙහි ආරෝපණ ඝනත්වය

$$= \frac{-1\times10^{-6}}{4\pi\times0.1^2}$$

$$= -7.96\ \mu C\ m^{-2}$$

(-7.9 සහ –8.1 අතර ඕනෑම අගයක් නිවැරදි යයි සැලකේ.)

බාහිර පෘෂ්ඨයෙහි ආරෝපණ ඝනත්වය = 0

04. (i) $F = \eta A \frac{v}{d}$

(ii)



සැ.යු. ඊතල වල දිග ක්‍රමයෙන් වෙනස් විය යුතු අතර ඊහිස එකම සරල රේඛාවක පිහිටිය යුතුවේ.

(iii) (a) $F = \eta A \frac{v}{d}$ මගින්

$$0.05 = \eta\times10^{-2}\times\frac{0.01}{1\times10^{-3}}$$

$$\eta = 0.5\ Nsm^{-2}$$

(ඒකකය ලෙස $kgm^{-1}s^{-1}$ ද නිවැරදි වේ.)

(b) $F = \mu R$

$$\mu = \frac{F}{R} = \frac{0.05}{0.5\times10}$$

$$\mu = 0.01$$

(c) කාර්යය කෙරෙන ශීඝ්‍රතාව = $F \times v$

∴ තත්පරයක් තුළදී ඉතිරි කරගත හැකි ශක්තිය

$$= 0.25\times0.01 - 0.05\times0.01$$

$$= 0.002\ J$$

(d) පෘෂ්ඨික ආතති බල මගින් කුට්ටිය මත පහළට බලයක් ක්‍රියා කරන බැවිනි.